10 APR 2008

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1533/16 - 2008 ජනවාරි 25 වැනි සිකුරාදා - 2008.01.25

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත

23 අ වගන්තිය යටතේ නියමය

1988 අංක 56 දරන සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, මේ නියමය මගින් දූෂණයට මග සලසමින් පරිසරයට අපද්‍රව්‍ය පිටමං කිරීමක්, තැන්පත් කිරීමක් හෝ මෝචනය කිරීමක් කෙරෙන කටයුතු හෝ එවැනි ප්‍රතිඵලයක් ඇති කෙරෙන කටයුතු වන්නා වූ ද මෙහි උපලේඛනයේ දක්වා ඇති නියමිත කටයුතු ඉහත කී වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා නියමිතව ඇත්තා වූ කටයුතු ලෙස නිශ්චය කරමි.

පාඨලී චම්පික රණවක,
පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍ය.

2008 ජනවාරි මස 14 වැනි දින,
කොළඹ දී ය.

උපලේඛනය

බලපත්‍රයක් ලබාගැනීමට අවශ්‍ය වූ නියමිත කටයුතු -

"අ" කොටස.

1. රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ හෝ නැවත ඇසුරුම් කිරීමේ කර්මාන්ත.
2. දෛනික නිෂ්පාදන ධාරිතාවය කිලෝ ග්‍රෑම් 1,000 හෝ ඊට වැඩි ප්‍රමාණයක් සබන්, ක්ෂාලක ද්‍රව්‍ය, මෘදු කාරක හෝ වෙනත් පිරිසිදු කාරක ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්ත.
3. වාහන ඉන්ධන පිරවුම් හල් හැර අනෙකුත් ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු ගබඩා හෝ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු පිරවුම් හල් හෝ ඒකාබද්ධ ධාරිතාවය මෙට්‍රික් ටොන් 150ක් හෝ ඊට වැඩි පෙට්‍රෝලියම් ද්‍රව තොග ගබඩා.

4. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි ගණනක් සේවයෙහි නියැලී සිටින අමු ද්‍රව්‍ය වශයෙන් ෆයිබර් ග්ලාස් භාවිත කිරීමේ කර්මාන්ත.

5. දිනකට දුම්ගැසූ දාර රබර් රොටි කිලෝග්‍රෑම 100කට අඩු ප්‍රමාණයක් නිෂ්පාදනය කරන කර්මාන්ත හැර කෘත්‍රිම රබර්, ස්වභාවික රබර් නිෂ්පාදනය කිරීමේ හෝ පිරිසැකසුම් කිරීමේ හෝ රබර් පාදක කරගත් කර්මාන්ත.

6. එක් තොගයකට මෙට්‍රික් ටොන් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක නිෂ්පාදන ධාරිතාවයක් සහිත සක්‍රීය කාබන් හෝ කාබන් කුඩු නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ අඟුරු නිෂ්පාදනය කරන කර්මාන්ත.

7. සේවක සංඛ්‍යාව 25ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආයුර්වේද, දේශීය ඖෂධ නිෂ්පාදනය කිරීමේ හෝ නිස්සාරණය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ නියැලී සිටින කර්මාන්ත.

8. රසායනික පොහොර නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ හෝ පිරිසැකසුම් කිරීමේ හෝ නැවත ඇසුරුම් කිරීමේ කර්මාන්ත.

9. පලිබෝධ නාශක, කෘමි නාශක, දිලීර නාශක සහ වල්නාශක, නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ හෝ නැවත ඇසිරීම් කිරීමේ කර්මාන්ත.

10. තෙල් (ඛණිජ තෙල් හෝ පෙට්‍රෝලියම් ) පිරිපහදු.

11. වර්ණක සහ වර්ණක අතරමැදි ඵල නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත.

12. සායම් (ඉමල්ෂන් හෝ එනැමල්), තීන්ත, වර්ණක, වාර්නිෂ්, පොලිෂ් වර්ග නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජන කිරීමේ කර්මාන්ත.

13. ඛණිජ තෙල් ආශ්‍රිත රසායනික ද්‍රව්‍ය (මූලික හෝ අතරමැදි ඵල ) නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත.

14. කාර්මික වායු නිෂ්පාදනය කිරීමේ හෝ පිරිසැකසුම් කිරීමේ හෝ නැවත පිරවීමේ කර්මාන්ත.

15. තාර මිශ්‍රණ (ඇස්පෝල්ට්) පිරිසැකසුම් කිරීමේ යන්ත්‍රාගාර.

16. බහු අවයවික (පොලිමර්) නිෂ්පාදනය කිරීමේ හෝ බහු අවයවික (පොලිමර්) ආශ්‍රිත නිෂ්පාදන (එනම් පොලිඑතිලීන්, පොලිවයිනයිල් ක්ලෝරයිඩ් (පී.වී.සී), පොලියුරිතීන්, පොලිප්‍රොපිලීන්, පොලියෙස්ටර්, නයිලෝන්, පොලිස්ටයිරින්, රෙසින්, වීදුරු කෙඳි හෝ වෙනත් කෘත්‍රිම කෙඳි වර්ග) නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ බහු අවයවික හෝ බහු අවයවික ආශ්‍රිත නිෂ්පාදන ප්‍රතිචක්‍රීකරණය කිරීමේ කර්මාන්ත.

17. සියලුම වර්ගයේ ටයර්, ටියුබ් නිෂ්පාදනය කිරීමේ හෝ ටයර් නැවත පිරවීමේ කර්මාන්ත.

18. බැටරි නිෂ්පාදනය කිරීමේ හෝ ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්ත.

19. ඇස්බැස්ටස් කෙඳි අමු ද්‍රව්‍යයක් ලෙස භාවිතා කරන කර්මාන්ත.

20. ඖෂධ අතරමැදි ඵල ඇතුළුව, බටහිර ඖෂධ, හෝ විලවුන් නිෂ්පාදනය කිරීමේ හෝ නිස්සාරණය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත.

21. ස්වභාවික ගම් හැර ඇලවෙන සුළු ද්‍රව්‍ය නිෂ්පාදනය කරන කර්මාන්ත.

22. ගිනිකූරු නිෂ්පාදන කර්මාන්ත සහ පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ කර්මාන්ත.

23. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩියෙන් සේවයේ යොදවන බතික් කර්මාන්ත.

24. රෙදිපිළි පිරිසැකසුම් කිරීමේ (විරංජන කිරීම, වර්ණ ගැන්වීම, මුද්‍රණය කිරීම ඇතුළුව) කර්මාන්ත හෝ ඇඟලුම් සේදීමේ කර්මාන්ත හෝ වැලි උපයෝගී කොට ගෙන රෙදි පිරිසැකසුම් කිරීමේ කර්මාන්ත හෝ සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩියෙන් සේවයේ යොදවන වාණිජ මට්ටමේ ඇඳුම් පිරිසිදු කිරීමේ කර්මාන්ත (ලොන්ඩරි).

25. සම් පදම් කිරීමේ කර්මාන්ත.

26. කාර්මික අපද්‍රව්‍ය ජනනය වන තෙත් ක්‍රියාවලි සහිත සම් නිමවුම් කිරීමේ කර්මාන්ත.

27. හණ පිරිසැකසුම් කිරීමේ කර්මාන්ත.

28. ස්වාභාවික කෙඳි විරංජනය කිරීමේ හෝ වර්ණ ගැන්වීමේ නියලුන කර්මාන්ත හෝ සේවක සංඛ්‍යාව 25 හෝ එයට වැඩි සංඛ්‍යාවක් සේවයේ යොදවන ස්වභාවික කෙඳි ආශ්‍රිත කර්මාන්ත.

29. යන්ත්‍ර 25ක් හෝ එයට වැඩි බලවේග පෙහෙකම්හල් හෝ කැඳ දැමීමේ ක්‍රියාවලි සහිත සියළුම බලවේග පෙහෙකම්හල්.

30. සීනි නිෂ්පාදනය හෝ සීනි පිරිපහදු කර්මාන්ත.

31. මධ්‍යසාර පැසවීමේ කර්මාන්ත (ස්කාගාර, බීර නිෂ්පාදනාගාර) හෝ මධ්‍යසාර අඩංගු බීම බෝතල් කිරීමේ කර්මාන්ත හෝ බෝතල් සේදීමේ ක්‍රියාවලිය සහිත බෝතල් කිරීමේ කර්මාන්ත.

2. සේවක සංඛ්‍යාව 25ක් හෝ ඊට වඩා සේවයේ යොදවන බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත ඇතුළු ආහාර නිෂ්පාදන සහ සැකසීමේ කර්මාන්ත.

3. මස් පිණිස සතුන් මරණ ස්ථාන.

4. සේවක සංඛ්‍යාව 25ක් හෝ ඊට වඩා වැඩි පොල්තෙල් සිඳීමේ හෝ කුරුඳු තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත.

5. පොල්තෙල් සිඳීමේ කර්මාන්ත සහ කුරුඳු තෙල් නිස්සාරණය කිරීමේ කර්මාන්ත හැර නිෂ්පාදන ධාරිතාව දිනකට ලීටර් 10ක් හෝ ඊට වැඩි අනෙකුත් ශාක හා සත්ව තෙල්/මේද නිස්සාරණය කිරීමේ කර්මාන්ත.

6. ක්ෂණික තේ හෝ කෝපි පිරිසැකසුම් කිරීමේ කර්මාන්ත.

7. සේවක සංඛ්‍යාව 25ක් හෝ ඊට වඩා සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

8. දිසිදි පොල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයින් 10 හෝ ඊට වැඩි ගණනක් සේවයේ යෙදෙන පොල් සැකසීමේ කර්මාන්ත.

9. වී පෙඟවීමේ ක්‍රියාවලිය සහිත දිනකට කිලෝ ග්‍රෑම් 5,000 ක් හෝ නිෂ්පාදන ධාරිතාවයක් සහිත වී මෝල් .

0. සියළුම යන්ත්‍රානුසාරයෙන් බිත්තර රක්කවන ස්ථාන හෝ පක්ෂීන් 2,500 හෝ එයට වැඩි කුකුළු ගොවිපලවල් හෝ සතුන් 50ක් හෝ ඊට වැඩි ඌරු, ගව, එළු ගොවිපලවල් හෝ සත්ව අනුපාතය *2,500 ක් හෝ ඊට වැඩි මිශ්‍ර ගොවිපලවල්.

* මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = පක්ෂීන් සංඛ්‍යාව + 50 x (ඌරන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව + එළුවන් සංඛ්‍යාව ).

1. දිනකට මෙට්‍රික් ටොන් 25ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක ධාරිතාවයක් සහිත සත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

2. සේවක සංඛ්‍යාව 50ක් හෝ ඊට වඩා සේවයේ යොදවන සිගරැට් හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

3. ඉලෙක්ට්‍රොප්ලේටින් සහ ගැල්වනයිස් කිරීමේ කර්මාන්ත ද ඇතුලුව ලෝහ හෝ ප්ලාස්ටික් පෘෂ්ඨ පිරියම් කිරීමේ කර්මාන්ත හෝ පවුඩර් කෝටින් කරන කර්මාන්ත.

4. යකඩ සහ වානේ කර්මාන්ත.

5. උඳුන් සහිත වාත්තු කර්මාන්ත.

6. ද්විතික ක්‍රියාවලි, උණු කිරීම සහ ලෝහ නැවත ලබාගැනීම සහිත යකඩ නොවන ලෝහ සැකසීමේ කර්මාන්ත.

7. සේවක සංඛ්‍යාව 25 හෝ ඊට වඩා සේවයේ යොදවන ලෝහ සංස්කාර්ය කර්මාන්ත හෝ යන්ත්‍රෝපකරණ, යන්ත්‍රෝපකරණ කොටස් හෝ ලෝහ භාණ්ඩ, විදුලි හෝ ඉලෙක්ට්‍රොනික භාණ්ඩ සහ උපකරණ නිෂ්පාදන කිරීමේ හෝ එකලස් කිරීමේ කර්මාන්ත (ලියවන පට්ටල්, වැල්ඩින් වැඩපලවල්, විසිරි පින්තාරු සිදුකරන කර්මාන්ත ඇතුළත්ව).

. සිමෙන්ති කර්මාන්ත (ක්ලින්කර් ඇඹරීම හෝ නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම).

. දිනකට ඝන මීටර් 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉක්මවන නිෂ්පාදන ධාරිතාවයක් සහිත කොන්ක්‍රීට් පූර්ව මිශ්‍රණ යන්ත්‍රාගාර.

. වීදුරු හෝ වීදුරු පදනම් වූ භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

. දිනකට මෙට්‍රික් ටොන් 20 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු.

. සේවක සංඛ්‍යාව 25ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යොදවන පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

. වරකට බෝර වලවල් එකකට වඩා වැඩි සංඛ්‍යාවක් පිපිරවීම සිදු කරන යාන්ත්‍රික කැණීම් හෝ වරකට එක් බෝර වලක් බැගින් පිපිරවීම් සිදුකරන මාසික නිෂ්පාදන ධාරිතාවය ඝන මීටර් 600ක් හෝ ඊට වැඩි යාන්ත්‍රික කැණීම්.

. බෙලිකටු සහ කළුගල් ඇඹරීමේ කර්මාන්ත හැර ලෝහමය නොවන ඛණිජ (එනම් හුණුගල්,ඩොලමයිට්, ඇපටයිට්, රොක්පොස්පේට්, වැලිගල්, පෙල්ඩ්ස්පාර්, ක්වාර්ට්ස්, ඉල්මනයිට්, රූටයිල්, සර්කෝන්, මයිකා, තලාතු මිනිරන්, පිඟන් මැටි ආදිය ) ඇඹරීම හෝ සැකසීම සිදුකරන කර්මාන්ත.

. කුට්ටි කළුගල් සෑදීම හෝ පිරිසැකසුම් කර්මාන්ත (පොළවෙන් ගැලවීම, පිපිරවීම, කැබලි කිරීම, ඔපදැමීම).

. දිනකට ඝන මීටර් 25ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉක්මවන ඒකාබද්ධ නිෂ්පාදන ධාරිතාවායක් ඇති කළුගල් ඇඹරීමේ හෝ පිරිසැකසීමේ කර්මාන්ත.

. අපසන්දන (කාර්මික හෝ මළ ) පොදු පරිපහදු පද්ධති.

. දිනකට මෙට්‍රික් ටොන් 05ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් යොදවුම් ධාරිතාවයක් ඇති දාහක.

. දිනකට ඝන මීටර් 10,000 කේ හෝ ඊට වැඩි පිරිපහදු ධාරිතාවයක් ඇති ජල පිරිපහදු පද්ධති.

. දෛනික යෙදවුම් ධාරිතාව මෙට්‍රික් ටොන් 10 හෝ ඊට වැඩි ප්‍රමාණයක නාගරික හා අනෙකුත් ඝන අපද්‍රව්‍ය මගින් කොම්පෝස්ට් නිෂ්පාදන සිදුකරන ස්ථාන.

61. දිනකට මෙට්‍රික් ටොන් 10ක් හෝ ඊට වැඩි ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ/ නැවත ලබාගැනීමේ හෝ සැකසීමේ කර්මාන්ත.

62. දිනකට මෙට්‍රික් ටොන් 10 හෝ ඊට වැඩි ධාරිතාවයක් සහිත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් හෝ ස්ථාන.

63. සියළුම විෂ සහිත සහ උපද්‍රවකාරී/ අන්තරාදායක අපද්‍රව්‍ය බැහැරලන ස්ථාන හෝ නැවත ලබාගැනීමේ / ප්‍රතිචක්‍රීකරණය කිරීම හෝ ගබඩා පහසුකම් ඇති ස්ථාන.

64. බෝරෝන් පිරියම් ක්‍රමය හැර දැව වර්ග රසායනික පිරියම් කිරීමේ හා ආරක්ෂණයේ නියුතු කර්මාන්ත.

65. දිනකට ඝන මීටර් 50ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉක්මවන ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ සේවකයින් 25 හෝ ඊට වැඩි ප්‍රමාණයක් සේවයේ යොදන දැව ආශ්‍රිත කර්මාන්ත.

66. නේවාසික කාමර 20ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඉක්මවන හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්.

67. නේවාසිකයන් 200 ට වැඩි නේවාසිකාගාර සහ එවැනි ලැගුම් හල්.

68. වෛද්‍ය රසායනාගාර හා පර්යේෂණ මධ්‍යස්ථාන ද ඇතුළුව ආසාදිත අපද්‍රව්‍ය උත්පාදනය කරන සෞඛ්‍ය සේවා මධ්‍යස්ථාන.

69. මෝටර් රථ හෝ බයිසිකල් නිෂ්පාදනය හෝ එකලස් කිරීමේ කර්මාන්ත.

70. ත්‍රිරෝද රථ සහ යතුරු පැදි සේවා ස්ථානහැර වාහන සේවා ක්‍රියාකාරකම් සහිත වාහන සේවා ස්ථාන හෝ වාහන සේවා කටයුතු සිදුකරන බහලුම් පර්යන්ත.

71. වාහන සේවා කටයුතු සිදුකරන සියළුම බස් ඩිපෝ සහ දුම්රිය අංගන.

72. සියළුම වාහනවලින් පිටවන දුම් පරීක්ෂා කිරීමේ මධ්‍යස්ථාන.

73. ජල හෝ සූර්ය හෝ සුළං විදුලි උත්පාදන බලාගාර සහ පොදු විදුලි බිඳවැටීම්වල දී පමණක් භාවිතා කරන විදුලි ජනක හැර විදුලිය නිෂ්පාදනය කිරීමේ එකක.

74. ඊයම් උණුකිරීම් සහිත මුද්‍රණාල හෝ පුවත්පත් මුද්‍රණාල හෝ අපජලය ජනනය වන මුද්‍රණ ක්‍රියාකාරකම් හෝ වර්ණ ඡායාරූප සැකසීමේ මධ්‍යස්ථාන.

75. පල්ප සහ කඩදාසි නිෂ්පාදන කර්මාන්ත හෝ රැලි සහිත කාඩ්බෝඩ් නිෂ්පාදන කර්මාන්ත.

76. එක් වැඩ මුරයක් සඳහා සේවක සංඛ්‍යාව 200ක් හෝ ඊට වඩා සේවයේ යොදවන ඕනෑම කර්මාන්තයක්.

77. කටුනායක අපනයන නිදහස් වෙළඳ කලාපය සහ බියගම අපනයන ප්‍රවර්ධන කලාපය ඇතුළු ජාතික පාරිසරික පනතේ IVඇ කොටස යටතේ අනුමත කරන ලද කර්මාන්ත ජනපද.

78. සත්වෝද්‍යාන.

79. විදුලි සංදේශනය, ගුවන් විදුලි හා රූපවාහිනී සේවා සඳහා පහසුකම් සපයන සම්ප්‍රේෂණ කුළුණු.

80. නිෂ්පාදන ක්‍රියාවලිය නිසා දිනකට අපජලය ඝන මීටර් 10ක් හෝ ඊට වඩා බැහැර කරන හෝ නිෂ්පාදන ක්‍රියාවලියේ දී විෂ රසායනික ද්‍රව්‍ය භාවිතා කරන මෙම ලැයිස්තුවේ වෙනත් තැනක සඳහන් කර නොමැති කර්මාන්ත.

## " ආ " කොටස

01. දිනකට කිලෝ ග්‍රෑම් 1,000ට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත සබන්, ක්ෂාලක ද්‍රව්‍ය හෝ වෙනත් පිරිසිදු කාරක ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්ත.

02. ඉන්ධන පිරවුම් හල් සහ ද්‍රවිකෘත පෙට්‍රෝලියම් වායු ගබඩා හැර ඒකාබද්ධ ධාරිතාව මෙට්‍රික් ටොන් 150ට අඩු පෙට්‍රෝලියම් ද්‍රව තොග ගබඩා.

03. සේවා නියුක්තයන් 10ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන ෆයිබර් ග්ලාස් අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිතා කරන කර්මාන්ත.

04. දිනකට නිෂ්පාදන ධාරිතාවය කිලෝ ග්‍රෑම් 50ට වැඩි සහ 100 ට අඩු දුම් ගැසූ දාර රබර් රොටි නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

05. එක් තොගයකට මෙට්‍රික් ටොන් 1 කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත සක්‍රීය කාබන් හෝ කාබන් කුඩු හෝ අඟුරු නිෂ්පාදන කර්මාන්ත.

06. සේවකයන් සංඛ්‍යාව 10ට වැඩි සහ 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්තව සිටින ආයුර්වේද, දේශීය ඖෂධ, නිෂ්පාදනය කිරීමේ හෝ නිස්සාරණය කිරීමේ හෝ සංයෝජනය කිරීමේ නියැලී සිටින කර්මාන්ත.

07. සේවක සංඛ්‍යාව 10ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන බතික් කර්මාන්ත.
08. සේවකයන් 10ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන වාණිජ මට්ටමේ ඇඳුම් පිරිසිදු කිරීමේ කර්මාන්ත (ලොන්ඩරි).
09. වියලි ක්‍රියාවලි ඇතුළත් සම් නිමවුම් කිරීමේ කර්මාන්ත.
10. ස්වභාවික කෙඳි විරංජනය කිරීමේ හෝ වර්ණ ගැන්වීමේ කර්මාන්ත හැර සේවකයින් 25 ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන ස්වභාවික කෙඳි ආශ්‍රිත කර්මාන්ත.
11. යන්ත්‍ර 25ට අඩුවෙන් ඇති බලවේග පෙහෙකම්හල්.
12. යන්ත්‍ර 10ට වැඩියෙන් ඇති අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ඇඳුම් ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරීමේ කර්මාන්ත.
13. එක් වැඩ මුරයක් සඳහා සේවකයන් 25 හෝ ඊට වැඩි සහ 200 ට අඩු සංඛ්‍යාවක් සේවයේ යොදවන ඇඟලුම් කර්මාන්ත.
14. සීනි නිෂ්පාදනය කිරීමේ හෝ සීනි පිරිපහදු කිරීමේ කර්මාන්ත හැර උක් ආශ්‍රිත කර්මාන්ත.
15. සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 25ට අඩුවෙන් සේවය කරන බේකරි සහ රසකැවිලි නිෂ්පාදන ඇතුළු ආහාර නිෂ්පාදන සහ සැකසීමේ කර්මාන්ත.
16. සේවක සංඛ්‍යාව 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන කුරුඳු තෙල් නිස්සාරණය කරන කර්මාන්ත.
17. වී පෙඟවීමේ ක්‍රියාවලිය සහිත හා දිනකට කිලෝ ග්‍රෑම් 5,000 ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත වී මෝල්.
18. මසකට නිෂ්පාදන ධාරිතාවය කිලෝ ග්‍රෑම් 1,000 හෝ ඊට වැඩි ධාරිතාවයක් සහිත ඇඹරුම් හල්.
19. පක්ෂීන් 250 හෝ ඊට වැඩි සහ 2,500 ට අඩු කුකුළු ගොවිපලවල් හෝ සතුන් සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 50ට අඩු වන්නාවූ ඌරු, එළු, ගව ගොවිපලවල් හෝ සත්ත්ව අනුපාතය* 250 හෝ ඊට වැඩි සහ 500 අඩු සංඛ්‍යාවක් සහිත මිශ්‍ර ගොවිපලවල්.
* මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය = කුකුළන් සංඛ්‍යාව + 50 x (ඌරන් සංඛ්‍යාව + ගවයින් සංඛ්‍යාව + එළුවන් සංඛ්‍යාව )
20. දිනකට මෙට්‍රික් ටොන් 25ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
21. සියළුම අයිස් නිෂ්පාදනාගාර.
22. සේවක සංඛ්‍යාව 25ට අඩුවෙන් සේවයේ යොදවන ලෝහ සංස්කාර්ය කර්මාන්ත හෝ යන්ත්‍රෝපකරණ, හෝ යන්ත්‍රෝපකරණ කොටස් හෝ ලෝහ භාණ්ඩ හෝ විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ සහ උපකරණ නිෂ්පාදනය කිරීමේ හෝ එකලස් කිරීමේ කර්මාන්ත (ලියවන පට්ටල්, වෑල්ඩින් වැඩපලවල්, විසිරි පින්තාරු කරන කර්මාන්ත ද ඇතුළත්ව).
23. දිනකට ඝන මීටර් 50ට අඩු ධාරිතාවයක් සහිත කොන්ක්‍රීට් පූර්ව මිශ්‍රණාගාර.
24. එක් වරකට එක් බෝරවලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත යාන්ත්‍රික කැණීම්.
25. (අත් මෙවලම් භාවිතා කර මිනිස් ශ්‍රමය පමණක් යොදා ගන්නා කළුගල් ඇඹරීමේ කර්මාන්ත හැර) දිනකට ඝන මීටර් 25ට වඩා අඩු ඒකාබද්ධ නිෂ්පාදන ධාරිතාවයක් ඇති කළුගල් ඇඹරීමේ හෝ සැකසීමේ කර්මාන්ත.
26. දෛනික යෙදවුම් ධාරිතාවය මෙට්‍රික් ටොන් 10ට අඩු ධාරිතාවයක් ඇති නාගරික හා අනෙකුත් ඝන අපද්‍රව්‍ය මගින් කොම්පොස්ට් නිෂ්පාදනය සිදුකරන ස්ථාන (ගෘහස්ථ නොවන).
27 දිනකට මෙට්‍රික් ටොන් 10ට අඩු ධාරිතාවයක් සහිත ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ / නැවත ලබාගැනීමේ හෝ සැකසීමේ කර්මාන්ත.
28. දිනකට මෙට්‍රික් ටොන් 10ට අඩු ධාරිතාවයක් සහිත ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් හෝ ස්ථාන.
29. නේවාසිකයින් 25 හෝ ඊට වැඩි සහ 200 ට අඩු නේවාසිකාගාර සහ එවැනි ලැගුම් හල්.
30. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා සවි කිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සහිත වාහන අලුත්වැඩියා කිරීමේ/ නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජ.
31. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍රවල ශීතකාරක ප්‍රතිචක්‍රීකරණය සහ ප්‍රතිග්‍රහණය කරන ස්ථාන.
32. ත්‍රිරෝද රථ, යතුරු පැදි, සේවා ස්ථාන හා වාහන ඇතුළත පිරිසිදු කිරීම පමණක් සිදුකරන ස්ථාන.
33. නිෂ්පාදන ක්‍රියාවලිය මගින් දිනකට අපජලය ඝන මීටර් 3ක් හෝ ඊට වැඩියෙන් සහ ඝන මීටර් 10කට අඩුවෙන් බැහැර කරනු ලබන ඕනෑම කර්මාන්තයක්.

## "ඇ" කොටස

01. සියළුම වාහන ඉන්ධන පිරවුම් හල් (ද්‍රව පෙට්‍රෝලියම් හා ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු).
02. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සේවයේ යෙදෙන ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.
03. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන පොල් තෙල් සිඳීමේ කර්මාන්ත.
04. සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහ 25 ට අඩු සේවක සංඛ්‍යාවක් සේවයේ යොදවන මධ්‍යසාර අඩංගු නොවන බීම වර්ග නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.
05. වියලි ක්‍රියාවලි සහිත වී මෝල්.

06. මාසික නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 1,000 කට අඩුවන ඇඹරුම් හල්.

07. දුම්කොළ වේලීමේ කර්මාන්ත.

08. සල්ෆර් දුම්ගැසීම සහිත එක් ක්‍රියාවලියක දී නිෂ්පාදන ධාරිතාව කිලෝග්‍රෑම් 500 හෝ එයට වැඩි ධාරිතාවක් සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත.

09. කෑමට ගන්නා ලුණු ඇසිරීමේ හා සැකසීමේ කර්මාන්ත.

10. ක්ෂණික තේ කර්මාන්ත ශාලා හැර අනෙකුත් තේ කර්මාන්ත ශාලා.

11. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත.

12. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

13. දිනකට මෙට්‍රික් ටොන් 20ට අඩු නිෂ්පාදන ධාරිතාවයක් සහිත හුණු පෝරණු.

14. ප්ලාස්ටර් ඔෆ් පැරිස් නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත හෝ සේවකයන් 25ට අඩු සංඛ්‍යාවක් සේවයේ නියුක්ත පිඟන් මැටි භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත.

15. සියළු බෙලිකටු ඇඹරීමේ කර්මාන්ත.

16. උළු සහ ගඩොල් කර්මාන්ත.

17. එක් වරකට එක් බෝර වලක් බැගින් පුපුරවමින් මසකට ඝන මීටර් 600ක නිෂ්පාදන ධාරිතාවයකට අඩු, මිනිස් ශ්‍රමය හා පුපුරණ ද්‍රව්‍ය භාවිතයෙන් සිදුකරන ලබන කැණීම් .

18. දිනකට ඝන මීටර් 50ට අඩු දැව ඉරුම් ධාරිතාවයක් ඇති ලී මෝල් හෝ බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතයෙන් දැව පිරියම් කිරීමේ කර්මාන්ත හෝ දැව පදම් කිරීමේ කර්මාන්ත.

19. බහු කාර්ය යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත හෝ සේවකයින් 5 ට වැඩි 25ට අඩු ගණනක් සේවයේ යෙදෙන දැව ආශ්‍රිත කර්මාන්ත.

20. නේවාසික කාමර 05 හෝ ඊට වැඩි සහ 20ට අඩු හෝටල්, ආගන්තුක නිවාස සහ තානායම්.

21. වාහනවල වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ, නඩත්තු කිරීමේ හා සවිකිරීමේ කටයුතු හෝ විසිරි පින්තාරු කටයුතු සිදු කරන ගරාජ හැර අනිකුත් වාහන අලුත්වැඩියා කිරීමේ/නඩත්තු කිරීමේ කටයුතු සිදුකරන ගරාජ.

22. ශීතකරණ හා වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම හා සවිකිරීම සිදුකරන ස්ථාන.

23. වාහන සේවා කටයුතු සිදු නොකරන කන්ටේනර් බහාලු පර්යන්ත.

24. සේවකයින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යවක් සේවයේ යෙදෙන සියළුම විදුලි හෝ ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ අළුත්වැඩියා කිරීමේ ස්ථා

25. ඊයම් උණු කිරීම සිදු කිරීම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරීමේ යන්ත්‍ර

2000.11.22 දින අංක 1159/22 දරන ගැසට් පත්‍රයේ පළකරනු ලැබුවා ද, මෙයින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වූ ක්‍රියාකාරකම් පිළිබඳ ගැසට් පත්‍රය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

02- 288

අංක 1699/4

2011.03.28

2A